# ආඬාගල තඹ සන්නසින් හෙළිවන මරළුවාව රජමහා විහාරයේ ඓතිහාසික පසුබිම

එස්.ඒ.එල්.අයි. නවරත්න[1], ආර්.එම්.එස්.කේ. රත්නායක[2]

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙගොඩ කෝරලේ මරළුවාව ගම්මානයේ මරළුවාව රජමහා විහාරය පිහිටා ඇත. මෙම විහාරයේ තිබී හමුවන තඹ සන්නස ද ඉතිහාසය ප්‍රතිනිර්මාණයේ දී වැදගත්වන පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස සැලකිය හැකිය. එය නමින් ආඬාගල තඹ සන්නසයි. විහාරයේ ඉතිහාසය පිළිබඳ හමුවන මූලාශ්‍රයමය සාධක අතර ඉතා වැදගත් ස්ථානයක් එම විහාරයේ තිබී හමුවන ආඬාගල තඹ සන්නසට ලැබේ. සන්නසක් ලියවන්නේ යම්කිසි පරිත්‍යාගයක් සංකේතවත් කිරීමටය. මෙම විහාරය දෙවනපෑතිස් රජ දවස පටන් පැවත එන්නක් බව මෙම සන්නස මඟින් පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ ලේඛනගතව ඇති ප්‍රධාන වංසකතාව වූ මහාවංසයේ ද සඳහන් නොවන කරුණු පවා මෙම සන්නසෙන් හෙළි වේ. මහාවංසයේ දුටුගැමුණු රජුගේ සොහොයුරියන් දෙදෙනෙකු ගැන සඳහන් නොවන අතර මෙම සන්නසෙහි ඒ පිළිබඳව විස්තර ඉදිරිපත් කර ඇත. දුටුගැමුණු රජුට නැගණියන් දෙදෙනෙකු සිටි බවත්, මෙම විහාරයේ සිටි මහාදේව තෙරුන් වහන්සේ සමග කුළුපග වී මේ විහාරයට ආ ගිය ඵුස්සදේව කුමරු දුටුගැමුණු රජුගේ නැගණියන් දෙදෙනාගෙන් එක් අයකුගේ පුතකු බව මෙම තඹ සන්නසෙහි සඳහන් වේ. එමෙන්ම මොහු මෙම විහාරයේ එනමින්ම පැවිදි වූ බැවින්, පසුව එම විහාරයේ චෛත්‍යයක් ඉදිකර, එම චෛත්‍යයේ කොත පැළඳවීමට දුටුගැමුණු රජු මහ පෙරහරින් වැඩම කළ බව ද විස්තර වේ. ඉන්පසු රජු මෙම විහාරයට ගම්බිම් පූජා කර සන්නසක් මඟින් ප්‍රධානය කර තිබේ. එපමණක් නොව මෙම විහාරයෙහි වැඩසිටි භික්ෂූන් වහන්සේලා කීප නමකගේ තොරතුරු ද පරාක්‍රමබාහු, බුවනෙකබාහු ආදී රජවරුන්ගේ නම් ද වෙනත් මූලාශ්‍රයවලින් හමු නොවන පිලැස්සේ රජු නම් තැනැත්තෙකු පිළිබඳ තොරතුරු ද මෙම සන්නසට ඇතුළත් වේ. ආඬාගල තඹ සන්නස කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ලියවන ලද්දක් වන අතර රජු එසේ සන්නස ලියා ඇත්තේ දුටුගැමුණු රජු දවස ලියවා තැබූ තඹ සන්නස දිරාපත්ව තිබීම නිසාය. ඔහුට පෙර ද රජවරු කීප දෙනෙක්ම සන්නස නැවත ලියවූ බව ද එහි සඳහන් වේ. ඒ රජු විසින් විහාරයක් කරවූ බවට ද තොරතුරු සන්නසෙහි දක්වා තිබෙන අතර මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය යොදා ගත් අතර ක්ෂේත්‍ර ගවේෂණය ආශ්‍රයෙන් තොරතුරු ඒකරාශි කිරීම ද සිදු කරන ලදි. පුරාවිද්‍යාත්මක වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන් ද වැදගත් මෙම ආඬාගල තඹ සන්නස ආශ්‍රිත තොරතුරු ප්‍රකාශයට පත්කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඉතා වටිනා අනාවරණය නොවූ ඓතිහාසික තොරතුරු රාශියක් අනාවරණය කරගැනීමට හැකියාව ලැබේ.

ප්‍රමුඛ පද : මරළුවාව රජමහා විහාරය, ආඬාගල තඹ සන්නස, පුරාවිද්‍යාත්මක වටිනාකම, කුරුණෑගල ඉතිහාසය

[1 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය lakmaliishara12@gmail.com